දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර
<u>රැස්වීම් වාර්තාව</u>

01. දිනය :- 2024.12.13 වේලාව :- පෙ.ව. 09.30

02. ස්ථානය :- ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර.

03. ප්‍රධානත්වය :- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා

04. මෙහෙයවීම :- දිස්ත්‍රික් ලේකම් චින්තක අබේවික්‍රම මහතා

05. සහභාගීත්වය :- මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පළාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 1)

**06. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම** :- දිස්ත්‍රික් ලේකම්/ දිසාපති විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අමතමින්, පැමිණ සිටි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන්, ආරක්ෂක අංශයේ සියළුම නිළධාරීන් ඉතා සුහදව පිළිගන්නා ලදී. අනතුරුව ගරු සභාපති වෙත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාර දෙන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් අද දින මේ ආරම්භ වන්නේ නව රජයේ ප්‍රථම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම බවත් එය සංවිධානය කිරීම වෙනුවෙන් ප්‍රථමයෙන් දිසාපතිතුමන් වෙත තම ස්තූතිය පිරිනමන ලදී. ඉන්පසු පැමිණ සිටි සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභාවේ සභාපති, දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, සියළුම ආයතන ප්‍රධානීන්, සියළුම ආරක්ෂක අංශවල ප්‍රධානීන් සහ අම්පාර දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය නිළධාරීන් පිළිගන්නා ලදී. මෙවර මැතිවරණයේදී ජනතාව විසින් මෙම ජනවරම ලබාදී ඇත්තේ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමාව යටතේ වංචාව, දූෂණය, හොරකමින් තොර සෑම පුරවැසියකුටම නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් ගොඩනැගීමට බවත් සඳහන් කරන ලදී. එම ජනතාවාදී බලාපොරොත්තු ඉටු කිරීමට රාජ්‍ය අංශයේ සියළුම නිළධාරීන්ට ධෛර්ය, ශක්තිය ඇති බවත් ඒ සඳහා සුභ පතන බවත් පැවසීය. මෙම රජය ප්‍රධාන ප්‍රතිපත්ති තුනක් මත ක්‍රියාකරන බව පැවසීය.

01. ග්‍රාමීය දුප්පත් බව තුරන් කිරීම.
02. ඩිජිටල්කරණය
03. පිරිසිදු ශ්‍රී ලංකාවක්

මෙමගින් අප රටේ සියළු පුරවැසියන්ට සාධාරණ සමාජයක් බිහිකරන බව පැවසීය. ඒ සඳහා දේශපාලන අධිකාරියේ සියළුම දෙනා කැප වන බවත් සඳහන් කරන ලදී. මෙම රැස්වීම හදිසියේ යොදාගත් බවත් අද දින සිකුරාදා දිනයක් බැවින් මුස්ලිම් ජනතාවගේ ආගමික කටයුතු පැවැත්වෙන නිසා ප.ව. 12.30 වන විට රැස්වීමේ කටයුතු අවසන් කරන බවත් පැවසීය.
ඉන්පසු න්‍යාය පත්‍රය අනුව මුලින්ම ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන සහ ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය හා 2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීමට දිස්ත්‍රික් ලේකම් වෙත ආරාධනා කරන ලදී.

**07. ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන සහ ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය හා 2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.**

මෙවර මහ කන්නයේ හෙක්ටයාර 84,731.84ක් වී වගා කර ඇති බවත්, බඩඉරිඟු හෙක්ටයාර 13,386ක් පමණ වගාකර ඇති බවත් මෙවර ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් යම් ප්‍රමාණයක් හානියට පත්ව ඇති බවත් සඳහන් කළ අතර දැනට ඒවා යථා තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන බවත් සඳහන් කරන ලදී. ගොවිජන සේවා

දෙපාර්තමේන්තුව මගින් යූරියා මිටියක් රු. 7500/- කටත්, TSP රු.10,500/- කටත්, MOP රු. 7400/- කටත් ලබාගත හැකි බව පැවසීය. පොහොර සහනාධාර ලෙස හෙක්ටයාර 1ක් සඳහා රු. 25,000/- ක් ලබාදෙන බවත් පැවසීය. පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 2,118ක් අවශ්‍ය වන බවත්, පොහොර සහනාධාරයේ පළමු වාරිකය ලෙස මිලියන 949ක් හෙක්ටයාර 63,313ක් වෙනුවෙන් ගොවීන් 76,038කට ද (ගෙවීම් ප්‍රගතිය 74.7%) සහ දෙවන වාරිකය ලෙස රුපියල් මිලියන 585ක් හෙක්ටයාර 58,501.60ක් වෙනුවෙන් ගොවීන් 70,352කට (ගෙවීම් ප්‍රගතිය 69%) ලෙස ද සම්පූර්ණයෙන් රුපියල් මිලියන 1,534ක් ගෙවා අවසන් බවත් පැවසීය. ඉතිරි ගෙවීම් කටයුතු සඳහා තවත් රුපියල් මිලියන 593ක් අවශ්‍ය වන බවත් ඉදිරියේදී එය ගෙවා අවසන් කරන බවත් පැවසීය. 2024/2025 වර්ෂයේ ලෝක ආහාර වැඩසටහන මගින් ගොවීන් වෙනුවෙන් නොමිලේ MOP පොහොර ලබාදීම වාරි පෝෂිත හෙක්ටයාර 1ක් වෙනුවෙන් කිලෝ 30ක් බැගින් උපරිම හෙක්ටයාර 2ක් සඳහා සහ වර්ෂා පෝෂිත හෙක්ටයාර 1ක් වෙනුවෙන් කිලෝ 25ක් බැගින් උපරිම හෙක්ටයාර 2ක් සඳහා ලබා දීමට කටයුතු කර ඇති බවත් සඳහන් කරන ලදී.

## 08. දිස්ත්‍රික් මට්ටමින් දේශීය හා විදේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය

### 8.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂ විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 02)

මින් ඉදිරියට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේදී රැස්වීම් දිනට දින 3කට පෙර ව්‍යාපෘති වල ප්‍රගතිය ඇතුලත් වාර්ථා, සියළුම දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්මේන්තු මන්ත්‍රීවරුන් වෙත ලබාදීමටත් ඉන් අනතුරුව එය පරිශීලනය කර ව්‍යාපෘති වල ගැටළු සහගත තත්ත්වයන් පමණක් රැස්වීමේදී සාකච්ඡා කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් යෝජනා සම්මත කරන ලදී.

දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බෙ මැතිතුමා අදහස් දක්වමින් ජනාධිපති ලේකම් වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලැබුණු එහෙත් ක්‍රියාත්මක නොකර ප්‍රතිපාදන නැවත පැවරීමට සිදුවන අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ව්‍යාපෘති නැවතත් ඉදිරි වසරේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට යෝජනා කරන ලදී. එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් සභාව වෙත දැනුම් දෙන ලද අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් වෙත සඳහන් කරන ලදී.

### 8.2 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CresMPA) අදාළ ව්‍යාපෘති ප්‍රගතිය

මෙම වැඩසටහනේ ප්‍රගතිය වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 03)

එහිදී දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බෙ මැතිතුමා විසින් අක්කරපත්තු පිල්ලෙ ආරු ප්‍රදේශයේ පවතින වාරිමාර්ග ව්‍යාපෘති ගැටළුවක් පිළිබඳ විමසන ලද අතර, එම ප්‍රදේශය අනවසර පදිංචි වීම් සහිත බැවින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව හරහා මැනුම් කර අදාළ ප්‍රදේශ නිරවුල් කරදෙන ලෙස 2023 වසරේ සිටම ලිඛිතව දන්වා ඇතත් මෙතෙක් එය සිදුකර දී නොමැති බව වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් සඳහන් කරන ලදී.

එබැවින් ඒ සම්බන්ධව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී දැනුවත් කර ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව වාර්තාවක් සකස් කර දිස්ත්‍රික් ලේකම්ට ද පිටපත් සහිතව වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත දැනුම් දෙන ලෙස එම ප්‍රදේශය භාර මිනින්දෝරු අධිකාරී වෙත දන්වන ලදී. එම ප්‍රගතිය අනුව අදාළ ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගත යුතු බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

තවද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා යම් ආයතන ප්‍රධානියෙකු සහභාගී නොවන්නේ නම් ඒ සම්බන්ධව පෙර දැනුම් දීමක් කළ යුතු බවත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

**8.3 වාරිමාර්ග අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමණාකරණ ව්‍යාපෘති (IWWRMP) ප්‍රගතිය**

මෙම වැඩසටහනේ ප්‍රගතිය පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 04)

**8.4 දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)**

මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලෝක බැංකු ණය වැඩසටහන් යටතේ 2009 වසරේ සිට ක්‍රියාත්මක ව්‍යාපෘතියක් බවත්, දැනට පළමු අදියර අවසන් කරගත නොහැකි වීම නිසා 2025 දෙසැම්බර් මස දක්වා කාලය දීර්ඝ කර ඇති බවත් සඳහන් කළ අතර, ලබන වසරේ දී එය අවසන් කරන බවත් දෙවන අදියර ලබන වසරේ සිට ආරම්භ කරන බවත්, මේ වන විට කිසිදු ගැටළුවක් නොමැති බවත් නැගෙනහිර පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සඳහන් කරන ලදී. (ඇමුණුම 05)

එම ව්‍යාපෘති සම්බන්ධව වාර්ථාවක් ලබා දෙන මෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

**8.5 ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)**

සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් මෙම ව්‍යාපෘතිය 2019 වසරේ සිට ක්‍රියාත්මක ලෝක බැංකු ණය ආධාර යටතේ ඩොලර් මිලියන 69ක්, යුරෝපා සංගමයේ ආධාර ලෙස ඩොලර් මිලියන 24ක් හා ශ්‍රී ලංකා රජයේ දායකත්වයත් සමග ඩොලර් මිලියන 100ක ව්‍යාපෘතියක් බව සඳහන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2024 වසරේ දෙසැම්බර් දක්වා කාලය දීර්ඝ කර ඇති බවත් සඳහන් කරන ලදී. (ඇමුණුම 06)

එම ව්‍යාපෘති සම්බන්ධව ද වාර්ථාවක් ලබා දෙන මෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

**09. පූර්ව ආපදා යාන්ත්‍රණය**

මෙය ආපදා කළමණාකරන මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 07)

**10. ෆෙන්ගල් සුලිකුණාටුවෙන් ඇතිවූ ගංවතුර ආපදා තත්ත්වය නිසා සිදුවූ හානි යථා තත්ත්වයට පත් කිරීමට එක් එක් ආයතනික මට්ටමින් ගෙන ඇති ක්‍රියා මාර්ග**

- වාරිමාර්ග

වාරිමාර්ග අධ්‍යක්ෂ අදහස් දක්වමින් මෙවර ඇතිවූ ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් මහ කන්නයේ වගාකල අක්කර 143,000 පමණවන භූමි ප්‍රමාණයෙන් අක්කර 64,000ක පමණ ජලයෙන් යටවී හානි සිදුවූ බවත්, ඇල මාර්ග, ගංඉවුරු 751ක් පමණ හානියට පත්ව ඇති බවත්, මේ වන විට ඉන් 583කට පිළියම් යොදා අක්කර 97,261කට වතුර ලබාදීමට හැකි ආකාරයට පත්කර ඇති බවත්, තවත් 168ක් පමණක් පිළිසකර කිරීමට ඇති බවත් ඉන් අක්කර 5,061කට ජලය ලබාදිය හැකි බවත්, තවත් නොබෝ දිනකින්ම එම කටයුතු අවසන් කල හැකි බවත් පැවසීය. ස්ථිර විසඳුම් වලට යාමට මේ අවස්ථාවේ පස් සොයා ගැනීමේ විශාල දුෂ්කර තත්ත්වයකට පත්ව ඇති බවත්, ගල්ඔය ඉවුරු දෙක මේ වන විට කුඹුරු කිරීමට කැපීම නිසා ඉවුරු නොමැති තත්ත්වයටම පත්ව ඇති බවත්, ගංවතුර පාලනය කිරීමට ගල්ඔය නිම්නයේ රක්ෂිතය නැවත ස්ථාපනය කලයුතු බවත්, එසේ කිරීමට යාමේදී ඉඩම්වල අයිතිය පිළිබඳ විශාල ගැටළු සහගත තත්ත්වයක් ඇති බවත් සඳහන් කරන ලදී. මෙම ගංවතුර ආපදා හානිය පිළිසකර කිරීමට මහා වාරිමාර්ග යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ මුළු වියදම් ඇස්තමේන්තුව මිලියන 2,056ක් (මහා වාරිමාර්ග ප්‍රතිසංස්කරණයට මිලියන 211ක්, කුඩා ඇලවල්/ කුණු ඇලවල් සඳහා මිලියන 542ක්ද, ගංඉවුරු, පිටවාන් ප්‍රතිසංස්කරණයට මිලියන 798ක්, නිර්මිත වලට සිදුවූ හානිය ප්‍රතිසංස්කරණයට මිලියන 308, කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණයට මිලියන 191ක් සහ කුඹුරුවල වැලි ඉවත් කිරීමට මිලියන 6) බව ප්‍රකාශ කරන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් ගංවතුර පාලනයට වාරිමාර්ග අධ්‍යක්ෂ පැවසූ ආකාරයට ගල්ඔය නිම්නයේ රක්ෂිතය නැවත ස්ථාපනය කිරීම සඳහා දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් වාරිමාර්ග/ කෘෂිකර්ම/ ගොවිජන සේවා/ භූ විද්‍යා අංශ ප්‍රධානීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඊලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ

කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැන්විය. තවද ගංවතුර පාලනය සඳහා දීර්ඝ කාලීන සැලැස්මක් සකස් කිරීම අත්‍යාවශ්‍ය බව පවසමින් අදාළ ආයතන ප්‍රධානීන් එක්ව එය සකස් කිරීමට කටයුතු කරන ලෙස යෝජනා කරන ලදී. එම සැලසුම් සකස් කිරීමේදී කුණු ඇලවල් නිසි පරිදි නඩත්තු කිරීම පිළිබඳව ද සැළකිලිමත් වන ලෙස දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මංජුල මීමන සුගත් රත්නායක මැතිතුමා විසින් සඳහන් කරන ලදී.

- **කෘෂිකර්ම**

අන්තර් පළාත් කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ අදහස් දක්වමින් මෙවර ගංවතුර ආපදා නිසා වී ගොවිතැන මෙන්ම අතිරේක බෝග වගාවන්ටද විශාල හානියක් සිදුව ඇති බව සඳහන් කරන ලදී. මෙවර බඩඉරිඟු හෙක්ටයාර් හත්දහස් ගණනක් වගාකලත් ඉන් 238ක් හානි වූ බවත්, කවුපි හෙක්ටයාර් 126ක් රටකජු හෙක්ටයාර් 150ක් මිරිස් හෙක්ටයාර් 7.5ක් මුංඇට හෙක්ටයාර 8ක් හානි වූ බව සඳහන් කරන ලදී. මෙම හානි වූ වගාවන් සඳහා නැවත වගා කිරීමට බීජ ලබාදිය හැකි බවත් හානිවූ පළතුරු වගාවන් වෙනුවෙන් පලතුරු බීජ පැල ලබාදීමේ හැකියාවත් ඇති බව සඳහන් කරන ලදී.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ අදහස් දක්වමින් මෙවර ගංවතුර ආපදා තත්ත්වය නිසා වී වගාකල හෙක්ටයාර් 8900ක් පමණ, බඩඉරිඟු හෙක්ටයාර් 30ක්, රටකජු හෙක්ටයාර් 28ක් මිරිස් හෙක්ටයාර් 14 ලෙස වගාවන් හානි වූ බව ප්‍රකාශ කරන ලදී. මේවන විට හානි වූ කුඹුරු යම් ප්‍රමාණයක් නැවත වගා කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් සඳහන් කරන ලදී. තවත් ඉදිරියේදී වැසි තත්ත්වය ඇතිවන බැවින් ගෙවතු වගා කිරීම සඳහා රජයෙන් එළවලු බීජ පැකට් ලබාදීමට හැකි නම් මහත් ප්‍රයෝජනයක් බව ප්‍රකාශ කරන ලදී. මිරිස් වගාව සඳහා සුදුසු පසක් සහිත එක්ගල්ඔය ප්‍රදේශයේ ගොවීන් විශාල ලෙස උක් වගාව සඳහා යොමුව ඇති බවත් හැකිනම් එය නැවතත් මිරිස් වගාව වෙත යොමු කරවීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී. ඒ සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා සඳහන් කරන ලදී.

අම්පාර දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ අදහස් දක්වමින් මෙවර සම්පූර්ණ වී වගාකල භූමි ප්‍රමාණය හෙක්ටයාර් 84,731ක් බවත් මහා පරිමාණ හානි හෙක්ටයාර 15,191බවත්, සුළු වගා හානි හෙක්ටයාර් 21,411 බවත් ප්‍රකාශ කරන ලදී. මෙවර වී අස්වැන්න මෙට්‍රික් ටොන් 15,000 ක් පමණ අඩු විය හැකි බවත්, අතිරේඛ ආහාර බෝග හෙක්ටයාර 13,386ක් වගා කර ඇති බවත් ඉන් හෙක්ටයාර 444ක් පමණ හානි වී ඇති බවත් පැවසීය.

බිත්තර වී නිෂ්පාදනය කරන ප්‍රමාණය වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් අම්පාර දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත දන්වන ලදී.

- **කෘෂි රක්ෂණ**

කෘෂි රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ අදහස් දක්වමින් 2023/2024 මහ කන්නයේ වගා හානි සඳහා කෝටි 31ක් වන්දි ලෙස ගෙවා ඇති බවත්, දින 14 පසු වී ඉල්ලීම් කර ඇති අයදුම්පත් 3,600ක් ප්‍රතික්ෂේප කර ඇති බවත් සඳහන් කරන ලදී. මේවන විට මෙම ප්‍රතික්ෂේප කල අයදුම්පත් සඳහා වන්දි ගෙවීමට ප්‍රධාන කාර්යාලයෙන් අනුමැතිය ලැබී ඇති බවත් ලබන ජනවාරි මාසයේ ගෙවීම් කරන බවත් සඳහන් කරන ලදී. මෙම කන්නයේ අක්කර 36,000ක් පමණ විනාශ වී ඇති බවත් තක්සේරු කිරීමට නිලධාරීන් හෙට දින පැමිණෙන බවත් හෙට සිට ලාහුගල, පානම ආදී ප්‍රදේශවල කුඹුරු හානි තක්සේරු කිරීම් සිදුකරන බවත්, අක්කරයක් සඳහා රු.14,400/-ක වන්දියක් ලබා දෙන බවත් පැවසීය. එම වන්දි මුදල් ලබන වසරේ ජනවාරි, පෙබරවාරි මාසවල ලබාදීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් අදහස් දක්වමින් මෙවර ගංවතුරෙන් හානි වී ඇති කුඹුරු ප්‍රමාණය අක්කර 36,595ක් බවත්, සුළු වාරිමාර්ග වැව් 6ක් සහ අමුණ 2ක් ඇල වේලි 22 හානිවී ඇති බවත්, සුළු හානි වැව් 16 ඇලමාර්ග 11 ලෙසත් සඳහන් කරන ලදී. කඩිනමින් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් මිලියන 5 ලැබුණු බවත් එයින් කර්මාන්ත 6ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇති බවත් සඳහන් කරන ලදී. ඊලඟ ගැටළුව ලෙස කුඹුරු වල තැන්පත් වී ඇති වැලි ඉවත් කිරීම සඳහන් කළ අතර, ඒ සඳහා ඊයේ දින දිසාපතිතුමන් ප්‍රමුඛව පැවති රැස්වීමේදී තම කුඹුරේ වැලි ඉවත් කිරීමට හැකියාව ඇති ගොවීන් සඳහා පවතින නීති අනුව ඒවා ඉවත් කිරීමට අවසර ලබා දීමට හා තම කුඹුරේ වැලි ඉවත් කිරීමට හැකියාවක් නොමැති ගොවීන් සඳහා අදාළ ගොවි සංවිධාන මගින් නීත්‍යානුකූලව අවසර ගෙන එම වැලි ඉවත් කිරීමට අවසර දීමටත් තීරණය ගත් බව

සදහන් කරන ලදී. (ප්‍රාදේශීය ලේකම් අනුමත කරන පොදු ස්ථානයක එම වැලි එක්රැස්කර වෙන්දේසි කිරීම මගින් හෝ සුදුසු කටයුත්තක් මගින් විකුණා ගොවි සංවිධාන අරමුදලට බැර කිරීමට / අදාළ ගොවි සංවිධානයට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති නම් ගොවිජන සංවර්ධන අරමුදල හෝ වෙනත් අරමුදලකින් එම වියදම් දරා එම වැලි විකිණීමෙන් පසු අදාළ රජයේ ප්‍රතිපාදන පියවා ගැනීම) මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සදහා මෙම කමිටුවේ අනුමැතිය බලාපොරොත්තු වන බව ද පැවසීය.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන බව පැවසීය.

- ➢ මහාමාර්ග

පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පාරවල් 7ක් පමණ මෙම ගංවතුර තත්ත්වය නිසා විනාශ වී ඇති බව සදහන් කරන ලදී. මහඔය ප්‍රදේශයේ මාර්ග හා ඔලුවිල් දීඝවාපි මාර්ගය මීටර 100ක් හානි වී ඇති බවත්, අලිගම්බේ පාර මීටර් 50ක් පමණ හානි වී ඇති බවත්, එම මාර්ග ප්‍රතිසංස්කරණය සදහා රුපියල් මිලියන 250ක් පමණ වැය වන බවත් සදහන් කරන ලදී. එම මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණයට කටයුතු කරන මෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු විධායක ඉංජිනේරු වෙත දන්වන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් අම්පාර ඉගිණියාගල මාර්ගයේ සංවර්ධන කටයුතු නිසි ප්‍රමිතියෙන් සිදු නොවන බවට ජනතාව විසින් පැමිණිලි කරන බවත් ඒ සම්බන්ධයෙන් අදාල නිළධාරීන් විසින් සොයා බලා එය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසත් දන්වන ලදී.

සහකාර පළාත් පාලන කොමසාරිස් අදහස් දක්වමින් මෙම ගංවතුර තත්ත්වය නිසා ප්‍රාදේශීය මාර්ග 324ක් (ඒවායේ දුර කිලෝමීටර 128 ක් පමණ) හා බෝක්කු 16ක් හානි වූ බව සදහන් කරන ලදී. මෙම හානි යථාවත් කිරීම සදහා පළාත් පාලන ආයතන සතුව පවතින යන්ත්‍රසූත්‍ර යොදාගත යුතු වුවද ඒවා වැඩි ප්‍රමාණයක් අලුත්වැඩියා කළයුතු මට්ටමේ පවතින නිසා හැකි ඉක්මනින් ඒවා අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම් කරන ලදී. ගංවතුර හේතුවෙන් හානි වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් මිලියන 3500ක පමණ ප්‍රතිපාදන අවශ්‍ය වන බවත් සදහන් කරන ලදී.

අදාළ පළාත් පාලන ආයතන වල අලුත්වැඩියා කළයුතු යන්ත්‍ර සූත්‍ර වල අලුත්වැඩියා සදහා සකස් කළ ඇස්තමේන්තු පිටපතක් ලබා දෙන ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් සදහන් කරන ලදී.

- ➢ ජල සැපයුම සම්බන්ධව

ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අම්පාර කළමණාකරු අදහස් දක්වමින් ජල සැපයුමට බාධා වන ආකාරයෙන් ස්ථාන 9ක් කැඩී ගිය බවත්, මේ වන විට ඒවා තාවකාලිකව සම්බන්ධ කර ජල සැපයුම යථාවත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙහිදී දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බේ මැතිතුමා විසින් සම්මන්තුර ප්‍රදේශයේ ජල සැපයුම් සම්බන්ධ ගැටළුවක් විමසන ලද අතර, ජලය ගෙන යන බට බන්ට් තුලින් ගමන් කරන බැවින් බන්ට් සාදන තුරු ස්ථිර විසදුම් ලබාදීම අපහසු බව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අම්පාර කළමණාකරු පැවසීය.

- ➢ විදුලි සැපයුම සම්බන්ධව

මෙවර ඇතිවූ ගංවතුර ආපදා තත්ත්වයෙන් රුපියල් මිලියන 10.5 පමණ හානියක් සිදුවූ බවත්, මේවන විට එම සියළුම විදුලි බිදවැටීම් යථා තත්ත්වයට පත්කර ඇති බව අම්පාර ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී.

- ➢ අධ්‍යාපන

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අදහස් දක්වමින් මෙම ගංවතුර ආපදා තත්ත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ පාසල් 123කට පමණ හානි සිදුව ඇති බවත්, හානි පිළිබඳ දළ ඇස්තමේන්තුව මිලියන 124ක් බවත් පැවසීය. තවම පාසල් නිවාඩු කාලය බැවින් දරුවන්ට අදාළව සිදුවූ හානි පිළිබඳ තොරතුරු එකතු කරමින් පවතින බවත්, හදිසි අලුත්වැඩියා කිරීම් කීපයක් පමණක් ඉටුකර ඇති බවත් ඉතිරි අලුත්වැඩියාවන් ලබන වසරේ ඇස්තමේන්තු වලට

ඇතුලත් කරන බවත් සදහන් කරන ලදී. දැනට විභාග කටයුතු පැවැත්වෙන බැවින් නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීම අපහසු වී ඇති බව සදහන් කරන ලදී.

➢ සෞඛ්‍ය

පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ අදහස් දක්වමින් ගංවතුර අවස්ථාවේදී ජනතාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සැපයූ බව සදහන් කරන ලදී. මෙහිදී රෝහල්වලට සිදුවූ සුළු හානි පිළිබඳව ඇස්තමේන්තු ලැබී ඇති බවත්, කල්මුණ ප්‍රදේශයේ ගිලන් රථයකට හානි සිදුව ඇති බවත් සදහන් කරන ලදී. දැනට උතුරු පළාතේ පැතිරී යන මී උණ රෝගී තත්ත්වය අම්පාර දිස්ත්‍රික්කය තුළ වාර්ථා වී නොමැති බවත් සදහන් කරන ලදී.

මෙහිදී අම්පාර මහ රෝහලේ අධ්‍යක්ෂ අදහස් දක්වමින් වැසි තත්ත්වය නිසා අම්පාර මහ රෝහලේ අභ්‍යන්තර මාර්ග පද්ධතියට හානි සිදුව ඇති බවත් එය පිළිසකර කර දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් මෙය සැම දෙනාටම අත්‍යාවශ්‍ය කරුණක් වන බැවින් සියළු අදාළ ආයතන එක්ව එම ප්‍රතිසංස්කරණයන් සිදු කර දෙන මෙන් යෝජනා කරන ලදී.

කල්මුණ අෂ්රෆ් නගර් රෝහලේ වැඩබලන අධ්‍යක්ෂ අදහස් දක්වමින් රෝහල අසලින් ඇති ඇල මාර්ගයේ කුණු හිරවීම නිසා ගංවතුර අවස්ථාවේ ද වතුර සම්පූර්ණයෙන්ම රෝහලට පැමිණීමෙන් සතියක් යන තුරු සම්පූර්ණ රෝහලම වසා තැබීමට සිදුවූ බවත් සදහන් කරන ලදී. අදාළ කාණු පද්ධතිය කඩිනමින් පිරිසිදු කරදෙන බවට ප්‍රදේශයභාර වාරිමාර්ග ඉංජිනේරු විසින් කමිටුව වෙත සදහන් කරන ලදී.

## 11. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01 | සම්මන්තුර ප්‍රාදේශීය සභා ව්‍යාපෘති 03ක් සඳහා අනුමැතිය ලබා ගැනීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් එම යෝජනා සදහා අනුමැතිය දෙන ලදී. |

## 12. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01 | උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගලහිටියාගොඩ හිමිදුරාව මාර්ගයේ 7 ඇල සිට හිමිදුරාව දක්වා ඇති කොටස ඉදිකිරීම නවතා දමා ඇති බැවින් එම මාර්ගය භාවිත කරන ජනතාව මහත් අපහසුතාවයට පත්ව ඇත. අදාල ආයතන විසින් එය පරීක්ෂා කර හැකි ඉක්මනින් පිළිසකර කිරීම. | මෙය I road ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘතියක් බවත් දැනට 7Km සංවර්ධනය කර ඇති බවත්, තවත් 3Km සංවර්ධනය කළයුතුව ඇති බවත්, මෙතෙක් අවසන් කර භාරදී නොමැති බවත්, පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු විසින් සදහන් කරන ලදී. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර සම්පූර්ණ වාර්ථාවක් ලබා දෙන ලෙස උහන ප්‍රාදේශීය ලේකම් වෙත දන්වන ලදී. |
| 02 | පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථිර ප්‍රාදේශීය ලේකම්වරයෙකු නොමැති වීමෙන් අදාළ කොට්ඨාසයේ ජනතාව සහ නිළධාරීන් අපහසුතාවයට පත්වන බව. | එරගම සහකාර ප්‍රාදේශීය ලේකම් නසීල් මහතා පත් කිරීම සුදුසු බවට නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නම් කර යවා ඇති බවත්, මෙවන විට සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් රාජකාරි ආවරණය කරන බවත් දිස්ත්‍රික් ලේකම් විසින් සදහන් කරන ලදී. |
| 03 | පසුගිය ගංවතුරින් කැඩී බිඳී ගිය මාර්ග සහ වාරිමාර්ග පිළිසකර කර ගැනීම | අදාළ ආයතන විසින් එම ප්‍රතිසංස්කරණ සිදු කරමින් පවතින බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් සදහන් කරන ලදී. |

| | | |
|---|---|---|
| 04 | උහන ප්‍රාදේශීය සභාවට බලතල සහිත ලේකම්වරයෙකු පත් කර නොමැති වීම. | වැඩ බැලීමේ පදනම මත පත් කිරීම සඳහා නමක් පළාත් සභාව වෙත යවා ඇති බවත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මැතිවරණ කාලසීමාවෙන් පසු මෙතෙක් රැස්වී නොමැති බවත්, ඉදිරි සතියක පමණ කාලය තුළ අදාළ පත් කිරීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇති බව අම්පාර සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් සඳහන් කරන ලදී. |
| 05 | ගංවතුරින් හානියට පත් වූ ඇල වේලි, පාලම් ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදුකර ගැනීම. | න්‍යාය පත්‍රය තුළ පෙර සාකච්ඡා කරන ලදී. |
| 06 | ගංවතුරෙන් හානියට පත් වූ ධීවර යාත්‍රා සඳහා වන්දි ලබාදීම | මිලියන 55ක වන්දි ඇස්තමේන්තුවක් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇති බව සඳහන් කරන ලදී. |
| 07 | ගංවතුර නිසා වාරිමාර්ග, කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්ට සිදුවූ හානි ප්‍රමාණය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියා මාර්ග පිළිබඳව දැනුවත් කිරීම. | න්‍යාය පත්‍රය තුළ පෙර සාකච්ඡා කරන ලදී. |
| 08 | වන අලින් ගම් වැදීම නිසා සිදුවන මිනිස් ජීවිත හානි සහ දේපල හානි අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග | වනජීවි සහකාර අධ්‍යක්ෂ අදහස් දක්වමින් දැනට අම්පාර ප්‍රාදේශයේ කාර්යාල 4කින් අවම නිළධාරීන් සංඛ්‍යාවකින් කටයුතු කරමින් පවතින බවත්, සිවිල් ආරක්ෂක නිළධාරීන්ගේ සහ බහුකාර්ය නිලධාරීන්ගේ සහාය ඇතිව කටයුතු කරන බවත් දැනට 200Km පමණ අලි වැට නඩත්තු කටයුතු සිදුකල යුතුව ඇති බවත් සඳහන් කරන ලදී. සංක්‍රමණය වන අලින්ගෙන් හානි සිදුවන බවත්, එය වලක්වා ගැනීමට අලි වෙඩි ලබාදෙන බවත්, පලවා හැරීම් සිදුකරන බවත් සඳහන් කරන ලදී.<br>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් අලිවැට නඩත්තු කිරීම සඳහා අදාළ නිලධාරීන් සඳහා පහසුකම් ලබා දී කෙටිකාලීනව වනඅලි නියාමනය ක්‍රමවත් කිරීමට හා දිගුකාලීනව ගතයුතු ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගනිමින් පවතින බවත් සඳහන් කරන ලදී. |
| 09 | මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිතව පවතින මුහුදු ඛාදනය අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග | දිස්ත්‍රික් ලේකම් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට පියවර ගතයුතු වීම. |
| 10 | මාවඩිපල්ලි සහ කිට්ටංකි ප්‍රදේශවල අතිරික්ත ජලය බැසයාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම | දිස්ත්‍රික් ලේකම් මේ සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කර කටයුතු කලයුතු වීම. |
| 11 | මහකන්නයේ වී මිළදී ගැනීමේ කටයුතු ගැටළුවලින් තොරව සිදු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම | දිස්ත්‍රික් ලේකම් මේ සම්බන්ධයෙන් වී අලෙවි මණ්ඩලය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා එක්ව කටයුතු කලයුතුයි. |

| | | |
|---|---|---|
| 12 | පාරිභෝගික අයිතීන් සහ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා හැකි ක්‍රමවේදයක් සකස් කිරීම | දිස්ත්‍රික් ලේකම් මේ සම්බන්ධයෙන් අදාල වගකිව යුතු ආයතන හා එක්ව කටයුතු කිරීම. |
| 13 | 01. ගංගා ජලජ ශාක ඉවත් කර පිරිසිදු කිරීම (සයින්දමරුදූ බොලිවේරියන් හා ග්‍රීන් ෆීල්ඩ් ප්‍රදේශ) සහ වෙරළබඩ ප්‍රදේශවල මෝයකට ප්‍රදේශ අපද්‍රව්‍ය ඉවත් කර පිරිසිදු කිරීම සම්බන්ධව<br>02. සායින්දමරුදූ ප්‍රදේශයේ 2000m³ ජල ටැංකියක් (Sump) ඉදිකිරීම සඳහා පවතින ගැටළු නිරාකරණය | මෙම ජල ටැංකියේ අවශ්‍යතාව සලකා බලා අනුමැතිය සඳහා අමාත්‍යාංශයට යවන බව ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ අම්පාර කළමණාකරු පවසන ලදී. |
| 14 | ගංවතුර තත්ත්වයෙන් හානියට පත්වූ මහඔය සිට ආරපොත තෙක් මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම | පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට කඩිනමින් මේ පිළිබඳ සොයා බලා කටයුතු කරන ලෙස දැන්විය. |
| 15 | 01.අම්/මහ/නුවරගලතැන්න මහා විද්‍යාලයේ අබලන් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම හෝ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම.<br><br>02.නවමැදගම ජල පාරිභෝගික හා සුභසාධක සමිතිය අක්‍රමවත්ව හා අනීතික ලෙස ජලසම්පාදන මණ්ඩලයට පැවරීම සම්බන්ධ ගැටළුව. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මෙය දැව වලින් සාදා ඇති ගොඩනැගිල්ලක් බවත් එය සම්පූර්ණයෙන්ම දිරාපත්ව ඇති බවත් නව ගොඩනැගිල්ලක් සෑදීමට රුපියල් මිලියන 7 ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කරන ලදී. මෙය ලබන වසරේ ඇස්තමේන්තු වලට ඇතුලත් කර ඇති බවත් සදහන් කරන ලදී.<br><br>මෙය නීත්‍යානුකූලව පවරාගෙන ඇති බව ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ අම්පාර කළමණාකරු පවසන ලදී. මෙම ගැටළුව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමට තීරණය විය. |
| 16 | මහඔය නගරයේ සිට පොල්ලේ බැද්ද හා රඹකැන්ඔය ජලාශ වෙත ගමන් කිරීමට ඇති ප්‍රධාන මාර්ගයේ ආරම්භයේ ඇති කෝසුව හා 2023 ගංවතුරින් විනාශ වූ කොටස 2024.11.26 දින ඇති වූ ආපදා තත්ත්වය නිසා නැවත කැඩී ඇත. මෙය කඩිනමින් පිළිසකර කල යුතුව ඇත. මේ නිසා ග්‍රාම නිළධාරී වසම් දෙකක පවුල් 1600ක් පමණ අපහසුතාවයට පත්ව ඇත. | මෙය සාදා නිම කිරීමට තිබුනේ පසුගිය ඔක්තොම්බර් මස බවත් නැවතත් ඇති වූ ගංවතුරෙන් ආපදාවට පත්ව ඇති බවත් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවසන ලද අතර, එය නියමිත ප්‍රමිතියෙන් සාදා නොමැති බව මහඔය ප්‍රාදේශීය ලේකම් විසින් සඳහන් කරන ලදී. මෙය ලබන වසරේ ජනවාරි වන විට සාදා දීමට පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව පොරොන්දු විය. |
| 17 | යෝජිත රඹකැන්ඔය බුදුරාපොත අලිවැට තවමත් ඉදි නොකිරීම නිසා පොල්ල බැද්ද ග්‍රාම නිළධාරී වසමේ නිවැසියන් නිරන්තරයෙන් වන අලි ප්‍රහාරයන්ට මුහුණ පායි. පසුගිය සති දෙකක කාලය තුලදී පමණක් වන අලි ප්‍රහාර නිසා නිවාස දහයක් පමණ විනාශ වී ඇත. යෝජිත අලි වැට වහාම ඉදිකල යුතුය. | මෙය ඉදිකිරීමට ලබන වසරේදී අමාත්‍යාංශයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලැබෙන බව වනජීවී දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරන ලදී. |
| 18 | ඔලුවිල් 01 ප්‍රදේශයේ හානි වූ මාර්ග ප්‍රතිසංස්කරණය | න්‍යාය පත්‍රය තුළ පෙර සාකච්ඡා කරන ලදී. |
| 19 | ඔලුවිල් 04 ප්‍රදේශයේ හානි වූ පාලම් 2ක් ප්‍රතිසංස්කරණය | න්‍යාය පත්‍රය තුළ පෙර සාකච්ඡා කරන ලදී. |
| 20 | 2024 ජනවාරි මාසයේ ඇති වූ ගංවතුර තත්ත්වයෙන් හානි වූ ගොවිබිම් සඳහා මෙතෙක් 50%ක වන්දියක් පමණක් ගෙවා තිබීම. | දින 14 පසු වී ඉදිරිපත් කල ඉල්ලුම්පත් වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බවත් ඒ සඳහා මේවන විට අනුමැතිය ලැබී ඇති බවත්, ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු කරන බවත් කෘෂිරක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ සඳහන් කරන ලදී. |

| | | |
|---|---|---|
| 21 | නාවිදන්වෙලි ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙහි කිට්ටංකි ස්ථානයේ පාලමක් ඉදිකර දෙන ලෙස ඉල්ලීම. | න්‍යාය පත්‍රය තුළ පෙර සාකච්ඡා කරන ලදී. |
| 22 | අම්පාරෙන් කොළඹට ධාවනය වන NTC 13417 හා NTC 13001 සුපෝපභෝගී බස්රථ දෙක ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් අත්තනෝමතික ලෙස අත්හිටුවීම. | මේ සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යතුමා සමග සාකච්ඡා කිරීමට තීරණය විය. |

**13.** ස්තුති කථාව

**14.** දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් පැමිණි සිටි සියලුදෙනාට ස්තුතිය පළකර රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්
අම්පාර.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය